දැරණියගල කොට්ඨාසය

**e-නැණපියස වැඩ සටහන**

**දියමන්ති ව්‍යාපෘතිය**

**සාමාන්‍ය පාඩම් - 11**

| විෂය | ශ්‍රේණිය | වාරය | පාඩම /ඒකකය |
|---|---|---|---|
| චිත්‍ර කලාව | 10 | II | 7.1.3.ඇම්බැක්කේ දේවාලය (II) |

**ඉගෙනුම් අත්වැල**

**ඇම්බැක්ක දේවාලයේ ලී කැටයම්**

- මෙම කැටයම් සඳහා භාවිත කර ඇත්තේ ගම්මාලු සහ පිහිඹියා යන දැව වර්ගයි.
- කැටයම් නෙලීමේදී අල්ප උන්නත නෙලීමේ ශිල්ප ක්‍රමය භාවිත කර ඇත.
- ප්‍රධාන තේමා පහක් යටතේ කැටයම් නිර්මාණය කර ඇත .

1.කල්පිත මෝස්තර 2.සත්ත්ව මෝස්තර 3. ජන ජීවිතය හා සම්බන්ධ කැටයම්

4. වාටි මෝස්තර (ලීස්තර ) 5. මල්කම් හා ලියකම්

- පාරම්පරික සිංහල සැරසිලි මෝස්තර අතර දැකිය හැකි සුවිශේෂී කල්පිත මෝස්තර රුසක් ඇම්බැක්කේ කැටයම් අතර වේ. උදාහරණ ලෙස **හේරුණ්ඩ පක්ෂියා,ඇත් කඳ ලිහිණියා ,සැරපෙන්දියා,වෘෂභ කුඤ්ජරය ,කිඳුරු රූපය, නාරිලතා,හංස පුට්ටුව** පෙන්වා දිය හැකි ය.
- ඇම්බැක්කේ කැටයම් අතර සත්ත්ව රූප සහිත කැටයම් නිර්මාණ දක්නට ලැබේ . උදාහරණ වශයෙන් **සිංහයා , හංසයා** පෙන්වා දිය හැකිය
- ඇම්බැක්ක දේවාල ලී කැටයම් අතර සුවිශේෂී නිර්මාණ වශයෙන් සැලකෙන සමකාලීන සමාජ ජීවිතය සම්බන්ධ අවස්ථා නිරූපණ කැටයම්. රුසකි. උදාහරණ වශයෙන් **රබන් වයන්නා,මල්ලව පොරය, අශ්වාරෝහකයා, හේවායා,දරුවාට කිරි පොවන මව, නළඟන** යනාදිය පෙන්වා දිය හැකි ය.
- **පනේල වටා වූ වාටි මෝස්තර(ලීස්තර)** සඳහා උද්භිත සැරසිලි මෝස්තර යොදාගෙන ඇත .මෙහිදී **අරිම්බුව ගල් බිංදු හා කුන්දිරික්කන්** වැනි නිර්ජීවී මෝස්තර ද **නෙලුම් මල් හා ලිය වැල්** වල උද්භිත මෝස්තර ද භාවිත කර ඇත.


හේරුණ්ඩ පක්ෂියා


වෘෂභ කුඤ්ජරය


කිඳුරිය


සිංහයා


හංස පුට්ටුව


මල්ලව පොර


කිරිදෙන මව


රබන් වයන්නා

අශ්වාරෝහකයා



නෙළුම(පේකඩ නිර්මාණ)



**ක්‍රියාකාරකම**

1. ඇම්බැක්ක දේවාලයේ කැටයම් නිර්මාණයට භාවිත කර ඇති දැව වර්ග මොනවාද ?
2. ඇම්බැක්කේ දේවාලේ කැටයම් නෙලීමට භාවිත කර ඇති ශිල්ප ක්‍රමය කුමක්ද ?
3. ඇම්බැක්කේ දේවාලයේ කැටයම් වර්ග කළ හැකි කොටස් මොනවාද? ඒවාට උදාහරණ ලියන්න.

**පැවරුම.- ඇම්බැක්ක දේවාලයේ දක්නට ලැබෙන දැව කැටයම් පිළිබඳ වැඩිදුර තොරතුරු එකතු කරන්න.**